# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1949/3 - 2016 ජනවාරි මස 11 වැනි සඳුදා - 2016.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

අතුරු ව්‍යවස්ථා

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

**අතුරු ව්‍යවස්ථා**

නින්දවූර් ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ උප වගන්ති (1), වගන්ති 123 සමග කියවන ලද 1989 වර්ෂයේ අංක 15 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ වගන්ති 2 ප්‍රකාරව නැගෙනහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන නසීර් අහමඩ් වන මා වෙත පවරනු ලබන බලතල වලට අනුකූලව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII) (ඊ) හා (XXX) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නින්දවූර් ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මා විසින් අනුමත කරනු ලැබ එල කිරීම සඳහා මෙයින් නියෝග කරමි.

නසීර් අහමඩ්,<br>
නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා<br>
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 ජූනි මස 06 වැනි දින,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,<br>
නැගෙනහිර පළාතේ පළාත් සභාව,<br>
ඇතුල් වරාය පාර,<br>
ත්‍රිකුණාමලය.

***ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

1 මෙම අතුරු ව්‍යවස්ථාවේ මින් මතු ප්‍රාදේශීය සභාව ලෙස හඳුන්වන ලබන **නින්දවූර්** ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.


1A - PG 2774— 14 (2016/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2 ප්‍රාදේශීය සභාව විසින් කලින් කලටප්‍රචාරක දැන්වීම් සඳහා

(අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේ ද යන්න තීරණය කරනු ලැබේ.

(ආ) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ හෝ ප්‍රදේශයන් පිළිබඳව කලින් කල ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය වන අතර, එකී නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

3 (අ) 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක හෝ ප්‍රාදේශීය සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම් තැනැත්තකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වා ගෙනයාමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය .

4 (අ) සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත්කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය .

(ආ) ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු බලපත්‍රයක් ලබා ඇත්තේ වුව ද කවර හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

5 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුව හොත් මිස ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

6 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තකු ම විසින්, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩකරන දින 2 කට පෙර මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් අයදුම් පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

7 මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබූ කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට වන ඉල්ලීමක් විය යුතු ය.

(ආ) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තකුට කලින් නිකුත් කළ බලපත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. එසේ වුව ද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම් දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධානය බාධාවක් නොවිය යුතු ය

(ඇ) ප්‍රදර්ශන බලපත්‍රය ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුළත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතු ය.

(ඈ) 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක, එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුවාත් හැර ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා වෙන්කළ කාලය ඉකුත් වී තිබිය යුතු ය.

(ඉ) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතු ය

(ඊ) බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් ම සමග මිලි මීටර් 210 X මිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1 ː 1000 පරිමාණයට අනුව පිළියෙල කළ දැන්වීමේ ආදර්ශයක් සහ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර් 210 Xමිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1 ː 1000 පරිමාණයට අඳින ලද භූමි සැලැස්මක්/සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර, ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතු ය.

(උ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය -

(i) ප්‍රාදේශීය සභාව විසින් 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිකළ දැකුම් පැළැල්ලක් වනවිට ඒ දැකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඒ අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවා තිබිය යුතු ය , නැතහොත්

(ii) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තකුට හෝ යම් අධිකාරයකට අයත් ස්ථානයක් වනවිට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතු ය.

8 ප්‍රචාරක දැන්වීම අසළින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිරවීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතු ය. එසේම වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියැදුරකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි අලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකළ යුතු ය.

9 ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුව සහ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඇප මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ බලපත්‍රය නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතු ය.

10 (අ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මත ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතු බලපත්‍ර ගාස්තුව, එකී බලපත්‍රය සඳහා අයකරනු ලබන ගාස්තුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියේ I වැනි තීරුවේ සඳහන් වාර්ෂික වටිනාකම සහ ඊට අනුරූපීව II වැනි තීරුවේ සඳහන් උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයේ ගාස්තුවක් විය යුතුවාත් හැර ප්‍රාදේශීය සභාව විසින් එකී ගාස්තුව වාර්ෂිකව පැනවිය යුතු ය.

(ආ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුව හොත් මිස එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

(ඇ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය තුළ දී ද එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව බලපත්‍රයක් ලබාගත යුතු ය.

(ඈ) (අ) ඡේදයේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඉ) මෙම ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද කිසියම් ආගමික කාර්යයක් හෝ මුදල් අයකිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. එසේ වුව ද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

11 (අ) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳව ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

12 ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ බලපත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13 (අ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපළකට අන්තරාදායකවන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ බලපත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල ප්‍රාදේශීය සභාව සතු විය යුතුවාත් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

14 ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතු ය.

15 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩකර ඇති අවස්ථාවක, ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමුකරන නිවේදනයක් සමග නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට තිබිය යුතු ය.

16 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු අතර එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

17 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අන්‍යාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

18 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනෙන් පසුව පැය හතළිස් අටක් ගතවීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19 (අ) 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ ක්‍රියාකිරීමෙන් අනතුරුව සභාපතිවරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදාළ බලපත්‍රය නිකුත් කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදල ආපසු ලබා ගැනීමට බලපත්‍රලාභියාට හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර-

(i) 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් බලපත්‍රලාභියා විසින් නිසි ආකාරයෙන් ඉටු කර තිබේද යන බව

(ii) දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, ඒ දැන්වීම ඉවත් කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසියම් හානියක් වී නොමැති බව තහවුරු කර ගැනීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) බලපත්‍රලාභියා විසින් 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාකර ඇති බව සහ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බව, (ආ) ඡේදයේ සඳහන් ආකාරයට තහවුරු කර ගැනීමේ දී සභාපතිවරයා සෑහීමට පත්වන්නේ නම් මිස, එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහස් කිරීම නොකළ යුතු ය. කිසියම් බලපත්‍රලාභියකු විසින් 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළල්ලට හානියක් සිදු වී ඇති විට, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්ය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා ප්‍රාදේශීය සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලෙන් අඩු කරගත යුතු අතර, ඉතිරිවන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් බලපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකි ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක, එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල බලපත්‍රලාභියා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

20 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපළක් බදුදීමට හෝ විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන "බදු දීමට තිබේ" හෝ "විකිණීමට තිබේ" හෝ "කුලියට දීමට තිබේ" යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම් අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

21 රජය හෝ පළාත් සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

22 කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ/හෝ ලිපිනය සමග වෙනත් කිසියම් වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් බලපත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතු ය.

23 කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රක්ෂේපනය කිරීම කවරකු විසින් හෝ නොකළ යුතු ය.

24 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ සභාපතිවරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිවරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

25 මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

26 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් .

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපැලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තෙකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්,හෝ එකී දැන්වීම නිසි ආකාරයෙන් භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නිත්‍යානුකූල වියයුතු ය.

27 මෙම අතුරු ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ විධිවිධාන යම් තැනැත්තෙකු විසින් ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුල උල්ලංඝණය කිරීම 1987 වර්ෂයේ අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122(2) වෙනි ඡෙදයේ විධිවිධානවලට අනුකූලව නිසිලෙස ඇති අධිකරණයක් විසින් වරද කරු කරණු ලැබීමෙන් අනතුරුව ඃ-

(i) ඒ තැනැත්තා විසින් කඩකිරීම හෝ උල්ලංඝණය කීරිම වරදක් සම්බන්දයෙන් රු 750ග00 ක දඩමුදලක් ගෙවිය යුතුය.ඃ

(ii) ඒ තැනැත්තා විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක එම කඩකිරීම් හෝ උල්ලංඝණය සිදුවන දිනක් වෙනුවෙන් රු 250 ක දඩ මුදලක් ගෙවිය යුතුය.

28 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව ද,

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"ලේකම්වරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"සභාපතිවරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"කටවුට්" යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක් ද

"දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක්, සවිකිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද ,

"ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළඳ දැන්වීමක් ද,අදහස් වේ.

*පළමුවැනි උපලේඛනය*

04 වැනි අතුරු ව්‍යවස්ථාව

................................................ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වන බලපත්‍රය

ගෙවන ලද බලපත්‍ර ගාස්තුව : රු. ............................බලපත්‍රයේ අනුක්‍රමික අංකය :..................

ඇප මුදලේ ප්‍රමාණය : රු. .............................................................................................. හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක................................ දරන හැඳුනුම් පත්‍රය හිමිකරු වන ..........................................................................යන අයට, ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත්ව 20.............................. මස ....................................වැනි දින....................................... සිට 20......................... මස................................. වැනි දින දක්වා වන කාලය ඇතුළත.......................................... ප්‍රාදේශීය සභා සීමාවේ පහත සඳහන් ස්ථානයේ/ස්ථානවල ප්‍රචාරක දැන්වීම/දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට මෙයින් බලය දෙනු ලැබේ.

ප්‍රචාරක දැන්වීම/දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලය ලබා දී ඇති ස්ථානය/ස්ථාන

01. ..............................................................................................................................

02. ..............................................................................................................................

03. ..............................................................................................................................

04. ........................................................................................................................................................

.....................................
සභාපති /බලයලත් නිලධාරියා,

ප්‍රාදේශීය සභාව.....................................

දිනය :................................................

*දෙවැනි උපලේඛනය*

06 වැනි අතුරු ව්‍යවස්ථාව

**ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අයදුම් පත්‍රය**

01. අයදුම්කරුගේ නම : ................................................

02. ලිපිනය :................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :................................................

04. දුරකථන අංකය :................................................

05. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ විස්තර :

(i) දැන්වීමේ ප්‍රමාණය : දිග : සෙ. මී................................................ පළල : සෙ. මී................................................

(ii) දැන්වීම් සංඛ්‍යාව : ................................................

(iii) දැන්වීමේ අන්තර්ගතය :................................................

(iv) ස්ථානගත කරන අන්දම :................................................

(v) ස්ථානගත කරන තැන් :................................................

(7 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ඊ) ඡේදයේ සඳහන් ආකාරයේ ආදර්ශයක් අමුණන්න.)

06. ඉල්ලා සිටින අවසර පත්‍රය වලංගු විය යුතු කාල සීමාව :

ආරම්භක දිනය : 20.............................................මස...............................................දින

අවසන්වන දිනය : 20............................................. මස............................................. දින

ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ලම පිළිපදින බවටත්, බලපත්‍රය වලංගු කාලය අවසන් වී දින දෙකක් ගතවීමට මත්තෙන් බලපත්‍රයට අදාළ ප්‍රචාරක දැන්වීම/දැන්වීම් හා ඊට යොදා ගෙන ඇති සියලු ද්‍රව්‍යයන් මාගේවියදමෙන් එකී ස්ථානයෙන්/ස්ථානවලින් ඉවත් කිරීමටත් ක්‍රියා කරන බවට මෙයින් පොරොන්දු වෙමි.

..............................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ...................................

01 - 903/1

---

## නැගෙනහිර පළාතේ පළාත් සභාව

### අතුරු ව්‍යවස්ථා

### නින්දවූර් ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ උප වගන්ති (1), වගන්ති 123 සමඟ කියවන ලද 1989 වර්ෂයේ අංක 15 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ වගන්ති 2 ප්‍රකාරව නැගෙනහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන නසීර් අහමඩ් වන මා වෙත පවරනු ලබන බලතල වලට අනුකූලව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) (ඌ) හා (XV) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නින්දවූර් ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මා විසින් අනුමත කරනු ලැබ එල කිරීම සඳහා මෙයින් නියෝග කරමි.

නසීර් අහමඩ්,
නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

*බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1 මෙම අතුරු ව්‍යවස්ථාවේ මින් මතු ප්‍රාදේශීය සභාව ලෙස හඳුන්වන ලබන **නින්දවූර්** ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 මෙම අතුරු ව්‍යවස්ථාව අරමුණු කොටගෙන සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුව හොත් මිස ඒ බලපත්‍රයනිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4 මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර කාලපරිච්ඡෙදයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන බේකරි සඳහා අතුරු ව්‍යවස්ථා 2 හි විධිවිධානය අනනුකූල නොවන අතර එවැනි බේකරි මින් මතු විධිවිධාන වලට අනුව බලපත්‍රයක් ලබා ගතයුතු අතර එවැනි කාලපරිච්ඡෙදය තුල එවැනි පුද්ගලයන් බේකරියක් නඩත්තු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූල වේ.

5 ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ වලට අනුව අයකරණ ලද ගාස්තුවක් ගෙවා ලබාගන්නා ලද ඉල්ලුම් පත්‍රය හරහා යම්කිසි පුද්ගලයන් ප්‍රාද්ශීය සභා බල ප්‍රදේශය තුල යම්කිසි බේකරියක් නඩත්තු කිරීම සඳහා බලපත්‍රයකට ඉල්ලුම් කල හැකිය.

6 යම්කිසි සාධාරණ කාරනයක් ඇත්තේ නම් මිස නිසිලෙස සම්පූර්ණ කරණ ලද ඉල්ලුම් පත්‍රයක් ලබාගන්නා දින සිට වැඩකරන දින 14 ක් ඇතුලත එවැනි පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කල යුතුය.

7 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් .

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපැලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තෙකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්,හෝ එකී දැන්වීම නිසි ආකාරයෙන් භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නිත්‍යානුකූල විය යුතු ය.

8 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ සභාපතිවරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිවරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

9 මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

10 මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) බේකරියේ නිෂ්පාදනය කරන කෑම වර්ග සඳහා තාපය ලබා ගන්නා මාධ්‍ය කවරක් වුව ද මේ ඡේදයේ සඳහන් නියමයන් සම්පූර්ණකර තිබිය යුතු ය.

(i) බේකරිය මනා අලුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතු ය,:

(ii) බේකරියේ සෑම කාමරයක ම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට ජනේල කවුළුවල වර්ගඵලය කාමර භූමියේ වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය,:

(iii) සෑම කාමරයක ම සිවිලිමක් සවිකර තිබිය යුතු අතර සුදු පාටින් තීන්ත ආලේපකර තිබිය යුතු ය,:

(iv) සෑම කාමරයක ම බිම සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,:

(v) බේකරියේ උඳුන ස්ථානගත කරනු ලබන කාමරය පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 3ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ බිත්තිය දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය,:

(vi) බේකරියේ උඳුන ස්ථානගත කළ කාමරය හැර සෙසු සෑම කාමරයක් ම පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 2.75ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ ඇළුමිනියම් සහ ලීයෙන් හෝ බැඳ දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය,;

(vii) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස්වල තීන්ත ආලේපකර තිබිය යුතු ය,;

(viii) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙළවරවල් පොළොව මට්ටමෙ සිට අවම වශයෙන් මීටර්1.8කට ඉහළින් තිබිය යුතුවාත් හැර අගු වාසිය අවම වශයෙන් මීටර් 1 විය යුතු ය,;

(ix) නිෂ්පාදන කාර්යය සඳහා පානය කිරීමට සුදුසු තත්ත්වයේ ජලය පාවිච්චි කිරීමට විධිවිධාන සලසා තිබිය යුතු ය,;

(x) නිෂ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකට ම ආරක්ෂිත ජල සැපයුමක් නළ මගින් සපයා තිබිය යුතු අතර බැහැර කරන අපවිත්‍ර ජලය ගලායාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් සකස් කර තිබිය යුතු ය,;

(xi) බැහැර කෙරෙන අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය,;

(xii) 17 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩපිළිවෙල ඇතිකර තිබිය යුතු ය.

(ආ) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය දර පාවිච්චි කරන බේකරියක් වන විට :

(i) බේකරියේ උඳුනේ දුම් කවුළුවේ ඉහළ කෙළවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 උසට බැඳ තිබිය යුතු ය,

(ii) පිටි අනන සියලු ම මේස මතුපිට පළුදු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැතිවනසේ පුරුද්දා තිබිය යුතු ය. නැතහොත් මල නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිද්දුම්වලින් තොරව ආවරණය කර තිබිය යුතු ය,

(iii) බේකරි උඳුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතු ය,

(iv) බේකරි උඳුනේ පිටත තීන්ත හෝ හුණු හා තිබිය යුතු ය,

(v) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර බේකරියට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(ඇ) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලිබලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට -

(i) බේකරි උපකරණවලට විදුලිය සම්බන්ධ කරන විදුලි පේනු ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර අධි වෝල්ටීයතාව ඇතිවන අවස්ථාවක දී හෝ විදුලිය කාන්දු වීමක දී විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතු ය,

(ii) බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය,;

(iii) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

11. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි සහ මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. පිටි ඇනීම සඳහා යොදා ගන්නා සෑම කාමරයක ම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනයක ම එක් වරක්වත් සේදීමට සැලැස්විය යුතු ය.

13. බේකරිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

14. බේකරි නිෂ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් පරිදි කාලයක් ඉදිරියට නොතිබින්නේ නම් මිස එකී කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

15. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවරහෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරික්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. බේකරියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් බේකරියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් බේකරියේ කාර්යයන් හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟසෝදා පිරිසිදු වී සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය වියයුතු ය.

17. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය,

(i) ජෛවභායන අපද්‍රව්‍ය, ඃ

(ii) වීදුරු,

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,

(vii) අන්තරාදායක අපද්‍රව්‍ය,යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණවැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළයුතු ය.

18 බේකරි නිෂ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතු ය

19. බේකරියේ පාවිච්චිය සඳහා තබාගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීමට ඒ සඳහා ම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබියයුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිත වූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුල්විය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතු ය.

20. 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේ දී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20ක් උස පාද මත තැනූ ලෑලි තට්ටුවක් යොදාගත යුතු අතර, එකී ලෑලි තට්ටු හිස්ව තිබෙන විට පහසුවෙන් එහා මෙහා ගෙන යා

හැකි ආකාරයෙන් නිම කර තිබිය යුතු ය. එසේ ම එකී ලෑලි තට්ටුව යටින් මීයන්ට සහ කවර හෝ වර්ගයක කෘමීන්ට රැඳී සිටිය නොහැකිවන සේ ආවරණය කර තිබිය යුතුවාක් හැර අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටිමීටර් 23ක් ඈතින් තබා තිබිය යුතු ය.

21. 20 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලෑලි තට්ටු අවම වශයෙන් මාසයකට දෙවරක් බැගින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම හෝ විවේක ස්ථානයක් ලෙස භාවිතා නොකළ යුතු අතර බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාරගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

23. බේකරියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස්කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙන ම වැසිකිළි තිබිය යුතු ය. එසේ ම එකී වැසිකිළි බේකරියේ කාමරවලසිට අවම වශයෙන් මීටර් 15ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය.

24. බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18කට අඩු දුරකින් කසළ වලක් හෝ පෝරවලක් හෝ අළුවලක් හේ ස්ථානගත කර නොතිබිය යුතු ය.

25. බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය.

26. කවර හෝ තැනැත්තෙකු විසින් බේකරිය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම හෝ වෙනත් සෞඛ්‍යයට හිත කර නොවන කවර හෝ ද්‍රව්‍යයක් සැපීම නොකළ යුතු ය.

27. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් සෑම ස්ථානයක ම හොඳින් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගණුදෙනු කරුවෙකු විසින් ඉල්ලා සිටින විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් බේකරි නිෂ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වියයුතු ය.

28. කිසියම් බේකරියක නිෂ්පාදනය කරන බේකරි නිෂ්පාදන බලපත්‍රලාභියා විසින් ම ප්‍රවාහනය කිරීම කරනු ලබන්නේ නම් දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

30. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

31. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 10 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූල පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒනියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

32. 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය.

33 පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝකරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය.

34 32 වැනි හෝ 33 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

35 මෙම අතුරු ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ විධිවිධාන යම් තැනැත්තෙකු විසින් ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුල උල්ලංඝණය කිරීම 1987 වර්ෂයේ අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122(2 ) වෙනි ඡෙදයේ විධිවිධානවලට අනුකූලව නිසිලෙස ඇති අධිකරණයක් විසින් වරද කරු කරණු ලැබීමෙන් අනතුරුව

(iii) ඒ තැනැත්තා විසින් කඩකිරීම හෝ උල්ලංඝණය කීරිම වරදක් සම්බන්දයෙන් රු 750.00 ක දඩමුදලක් ගෙවිය යුතුය.

(iv) ඒ තැනැත්තා විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක එම කඩකිරීම් හෝ උල්ලංඝණය සිදුවන දිනක් වෙනුවෙන් රු 250.00 ක දඩ මුදලක් ගෙවිය යුතුය.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -"

ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව ද,

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙහි කවර හෝ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙහි කවර හෝ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"ලේකම්වරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"සභාපතිවරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බේකරි නිෂ්පාදන" යන්නෙන්, විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත කිසියම් බේකරියක නිපදවන පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලි ද, අදහස් වේ.

"බේකරිය" යන්නෙන් විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ රස කැවිලි සාදන යම් ස්ථානයක් අදහස් වන අතර එවැනි ආහාර පිළිවෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තබන කිසියම් ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**නින්දවූර් ප්‍රාදේශීය සභාව**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ උප වගන්ති (1), වගන්ති 123 සමඟ කියවන ලද 1989 වර්ෂයේ අංක 15 දරන **පළාත් සභා (අනුෂංගික විධිවිධාන)** පනතේ වගන්ති 2 ප්‍රකාරව නැගෙනහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන නසීර් අහමඩ් වන මා වෙත පවරනු ලබන බලතල වලට අනුකූලව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) (ඔ) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව **නින්දවූර්** ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද අන්තරාදායක සහ පීඩාකාරී ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මා විසින් අනුමත කරනු ලැබ එල කිරීම සඳහා මෙයින් නියෝග කරමි.

නසීර් අහමඩ්,
නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

***අන්තරාදායක සහ පීඩාකාරී ව්‍යාපාර පිළිබඳ අතුරුව්‍යවස්ථා***

1 මෙම අතුරු ව්‍යවස්ථාවේ මින් මතු ප්‍රාදේශීය සභාව ලෙස හඳුන්වන ලබන නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මින් මතු ව්‍යාපාර ලෙස හඳුන්වනු ලබන අන්තරාදායක සහ පීඩාකාරී ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 මෙම අතුරු ව්‍යවස්ථාවේ ව්‍යාපාර යනුවෙන් හඳුන්වන්නේ ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණයකට අනුකූලව උපලේඛන I, II සහ III හි පෙල ගැස්මේ අන්තර්ගතය ව්‍යාපාරය වේ.

3 මෙම අතුරු ව්‍යවස්ථාව අරමුණු කොටගෙන සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළව්‍යාපාර පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුව හොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

5 මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර කාලපරිච්ඡෙදයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ව්‍යාපාර සඳහා අතුරු ව්‍යවස්ථා 3 හි විධිවිධානය අනනුකූල නොවන අතර එවැනි ව්‍යාපාර මින් මතු විධිවිධාන වලට අනුව බලපත්‍රයක් ලබා ගතයුතු අතර එවැනි කාලපරිච්ඡෙදය තුල එවැනි පුද්ගලයන් ව්‍යාපාර නඩත්තු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූල වේ.

6 ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ වලට අනුව අයකරණ ලද ගාස්තුවක් ගෙවා ලබාගන්නා ලද ඉල්ලුම් පත්‍රය හරහා යම්කිසි පුද්ගලයන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම්කිසි ව්‍යාපාර නඩත්තු කිරීම සඳහා බලපත්‍රයකට ඉල්ලුම් කල හැකිය.

7 යම්කිසි සාධාරණ කාරනයක් ඇත්තේ නම් මිස නිසිලෙස සම්පූර්ණ කරණ ලද ඉල්ලුම් පත්‍රයක් ලබාගන්නා දින සිට වැඩකරන දින 14 ක් ඇතුලත එවැනි පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කල යුතුය.

8 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් .

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපෑලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තෙකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්,හෝ එකී දැන්වීම නිසි ආකාරයෙන් භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නිත්‍යානුකූල විය යුතු ය.

9 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධාන යටතේ සභාපතිවරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිවරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

10 මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්‍ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්‍ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්‍ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

11 මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ව්‍යාපාර බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි ප්‍රදේශය ඃ

(i) සභාපතිවරයා විසින් සෑහීමකට පත්වන තත්ත්වයට ශක්තිමත් වූ හා අපේක්ෂිත ප්‍රමාණයේ පාරිභෝගිකයන්ට පහසුකම් සලසා දිය හැකි ප්‍රමාණවත් ඉඩකඩ සහිත වූ හා අවදානම් හා හානි රහිත එකක් විය යුතුය.

(ii) එම පරිශ්‍රය නිසි පරිදි නඩත්තු කළ යුතු අතර මනා වාතාශ්‍රයක් මෙන්ම හොඳින් ආලෝකය ලැබෙන සේ සකස් විය යුතුය සෑම කාමරයක ම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතුය.

(iii) සභාපතිවරයා විසින් සෑහීමකට පත්වන අයුරින් සෑම කොටසකම පිහිටි කාමරවල බිත්ති ගඩොල්, කළු ගල් හෝ කබොක් ගල් වලින් මීටර් 2.14 ට වඩා නොඅඩු උසකින් ඉදි කළ යුතු අතර එම බිත්තිවල ඇතුළත පැත්තේ පහළ මීටර් දෙකක සිමෙන්ති හෝ වෙනත් සුදුසු ද්‍රව්‍යයක් යොදා කපරාරු කර තැබිය යුතු අතර ඇතුළත පැත්තේ ඉතිරි කොටස හුණු කපරාරු කර හෝ හුණු පිළියම් කොට තිබීම ප්‍රමාණවත් වේ.

(iv) සෑම පියසි කෙළවරක්ම පොලෝ මට්ටමේ සිට මීටර දෙකට වඩා උසින් පිහිටිය යුතුය.

(v) සභාපතිවරයා විසින් නියම කොට දක්වා ඇති ප්‍රමිතීන්ට සරිලන පරිදි වහලය කල් පවත්නා අමු ද්‍රව්‍යයකින් නිමවා තිබිය යුතුය.

(vi) ගොඩනැගිල්ලේ සියළුම දැව අශ්‍රිත නිපැයුම් දැව ආරක්ෂණ ආලේපන යොදා හෝ දැව ආරක්ෂිත තෙල් යොදා හෝ දැව පොලිෂ් භාවිතාකොට තිබිය යුතුය.

(vii) සභාපතිවරයා විසින් නියම කොට දක්වා ඇති ප්‍රමිතීන්ට සරිලන පරිදි ජලය කාන්දු නොවන අයුරින් මුලු බිම් ප්‍රමාණයම සිමෙන්ති තනා තිබිය යුතුය.

(viii) සභාපතිවරයා විසින් නියම කොට දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පරිශ්‍රය, ප්‍රමාණවත් කාණු පද්ධතියකින් සමන්විත විය යුතුය.

(ix) ඇතුළත විදුලි රැහැන් ඇදීම සහ ඒ සඳහා සවිකර ඇති අවශ්‍ය ආරක්ෂණ පෙර සූදානම සම්බන්ධයෙන් විදුලි අධිකාරීවරයෙකු හෝ ඒ සඳහා වෘත්තීය වශයෙන් පුහුණු කරන ලද තාක්ෂණික නිලධාරියෙකු හෝ එම තාක්ෂණික නිලධාරියා වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිළධාරියකු විසින් අදාළ පරිශ්‍රය සඳහා අනුමැතිය ලබා දී තිබිය යුතුය.

(ආ) සෑම බලපත්‍රලාභියෙකු විසින්ම සපුරාලිය යුතු පොදු කරුණු ඃ

(i) සෑම බලපත්‍රලාභියෙකු විසින්ම තම ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය කිසිදු දුර්ගන්ධයක් හෝ වෙනයම් වූ පීඩාවක් ඇතිවීම වළක්වන්නා වූ ආකාරයකින් ගබඩා කළ යුතුය.

(ii) කවර වූ පීඩාවක් හෝ දුර්ගන්ධයක් හෝ ඇතිකළ හැකි ද්‍රව්‍ය පොදු ස්ථානයක් හෝ මහා මාර්ගයක් හරහා ප්‍රවාහනය කරන විට හෝ ඒවා මගින් පොදු ජනතාවට කිසිඳු පීඩාවක් හෝ දුර්ගන්ධයක් හෝ ඇති නොවනු පිණිස ඒවා ආවරණිත සහ තෙතමනය කාන්දු නොවන්නා වූ බහාලුම්වල බහා ප්‍රවාහනය කළ යුතුය.

(iii) සෑම බලපත්‍රලාභියකු විසින්ම කවර හෝ නිෂ්පාදන ක්‍රියාවලියකදී පිට කෙරෙන්නා වු කවර හෝ අප්‍රසන්න වාෂ්ප හෝ වායු, හානිකර හෝ අප්‍රසන්න ප්‍රතිඵල ඇති නොවන ලෙස ඒවා විසිරී යන තරම් වූ ආකාරයේ උසකට මුදාහැරීම හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා වෛද්‍ය නිලධාරි නිර්දේශ ප්‍රකාර ඍජුවම ගින්නක් හරහා යැවීම හෝ සනීකරණ උපකරණයක් තුළට යැවීම සිදුකළ යුතුය.

(iv) සෑම බලපත්‍රලාභියකු විසින්ම අදාළ ව්‍යාපාරය සිදු කරන්නා වූ පරිශ්‍රය සඳහා ප්‍රමාණවත් කානු පද්ධතියක් සකසා ඒවා හොඳින් නඩත්තු කිරීමට වග බලා ගනිමින් දිනපතා සේදිය යුතුය.

(v) සෑම බලපත්‍රලාභියකු විසින්ම ව්‍යාපාරය කරගෙන යන්නා වූ පරිශ්‍රයේ බිම යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ගොඩ නගා මනා තත්ත්වයකින් නඩත්තු කරමින් දිනපතා පිරිසිදු කරවීමට වගබලා ගත යුතුය.

(vi) සෑම බලපත්‍රලාභියකු විසින්ම ව්‍යාපාරය පවත්වාගෙන යන්නා වූ පරිශ්‍රයේ බිත්ති, කැලිකසල වලින් පිටකරන තෙතමනය අවශෝශනය වලකන ආකාරයට යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර ඒවා වාර්ෂිකව පින්තාරු කළ යුතුය.

(vii) සෑම බලපත්‍රලාභියකු විසින්ම අදාල ව්‍යාපාරය හා සම්බන්ධ උපකරණ හා භාජන ඇතුළු සියළුම මෙවලම් පිරිසිදුව තබා ගන්නා අතර දිනපතා පිරිසිදු කරවීමට වගබලා ගත යුතුය.

(viii) සෑම බලපත්‍රලාභියකු විසින්ම අපද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන සමගින් සියලු ඉවත ලන ද්‍රව්‍ය, අතුගා ඉවත ලන දේ හා ඇතිල්ලීම් මගින් ජනිතවන කොටස්, එම පරිශ්‍රයේදීම තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, දිනපතා ආවරණිත බහාලුම්වල බහා බැහැර කරවිය යුතුය.

(ix) සෑම බලපත්‍රලාභියකු විසින්ම ඇඟ සේදීම හෝ වෙනයම් ද්‍රව්‍යක් බහා සේදීමට භාවිතා කරන්නා වූ ටැංකි, දුර්ගන්ධය වැළැක්වීම සඳහා හැකිතාක් වරක් හිස් කොට පිරිසිදු කරවිය යුතුය.

(x) බැහැර කෙරෙන අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය,

(xi) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ව්‍යාපාරයට විදුලි සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

12. ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස කිසියම් වසුරු, ඇට කුඩු පොර, යම් විෂ සහිත හෝ පීඩාකාරි දුර්ගන්ධයක් මතුවන කිසියම් ද්‍රව්‍යක් ව්‍යාපාරය පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

14. කවර හෝ ව්‍යාපාර ශාලාවක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතු යි.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත අලේප කිරීම කළ යුතු යි.

16 ව්‍යාපාරය සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු ලී බඩු හා උපකරණ ද පිරිසිදු ව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

17 පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කර නැවත පාවිච්චි කිරීම සඳහා එකී ඇසුරුම් යොදා ගන්නා ව්‍යාපාරය එකී පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කිරීමේ දී -

(අ) එකි ඇසුරුම්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

(ආ) එකී ඇසුරුම් අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද, යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිත කළ යුතු අතර, එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මගින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

18. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකු ගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරික්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

19 ව්‍යාපාරයේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් ව්‍යාපාරයේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය වියයුතු ය.

20. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය

(i) ජෛවහායන අපද්‍රව්‍ය,

(ii) වීදුරු,

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,:

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,:

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්

(vii) අන්තරාදායක අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ජේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණවැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළයුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූල පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය

23. 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝකරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය

24 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

25 මෙම අතුරු ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ විධිවිධාන යම් තැනැත්තෙකු විසින් ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුල උල්ලංඝණය කිරීම 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122(2 ) වෙනි ඡෙදයේ විධිවිධාන වලට අනුකූලව නිසිලෙස ඇති අධිකරණයක් විසින් වරද කරු කරණු ලැබිමෙන් අනතුරුව

(i) ඒ තැනැත්තා විසින් කඩකිරීම හෝ උල්ලංඝණය කීරිම වරදක් සම්බන්දයෙන් රු 750.00ක දඩ මුදලක් ගෙවිය යුතුය.

(ii) ඒ තැනැත්තා විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක එම කඩකිරීම් හෝ උල්ලංඝණය සිදුවන දිනක් වෙනුවෙන් රු 250.00ක දඩ මුදලක් ගෙවිය යුතුය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව ද,

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙහි කවර හෝ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද

"බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙහි කවර හෝ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"ලේකම්වරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"සභාපතිවරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,අදහස් වේ.

*උපලේඛනය I : පීඩාකාරී ව්‍යාපාර*

1. මිනිරන් පදම් කිරීම සහ ගබඩා කර තැබීම
2. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ විකිණීම
3. හම් පදම් කිරීම
4. හම් විකිණීම

5. සත්ත්ව පාලනය (ආහාර සඳහා, කිරි හෝ බිත්තර)
6. උම්බලකඩ නිෂ්පාදනය
7. රබර් නිෂ්පාදනය සහ රබර් රොටී ගබඩා කර තැබීම
8. පශු ගිලන් හලක් තබා ගැනීම
9. තොග වෙළඳමේ අරමුණින් නශ්‍ය ආහාර හෝ ආහාර ද්‍රව්‍යය තබා ගැනීම
10. කිලෝ ග්‍රෑම් 150 සීමාව ඉක්මවමින් කරවල, මුහුදු මසුන් හෝ ජාඩි තබා ගැනීම
11. මස් හෝ මාළු යොදා ගනිමින් ජාඩි සෑදීම, මස් හෝ මාළු වේලීම හෝ මස් හෝ මාළු ශීත කිරීම
12. පොල් කටු අඟුරු හෝ වැව අඟුරු නිෂ්පාදනය කිරීම
13. දුම්කොළ වේලීම
14. සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම
15. පුන්නක්කු නිෂ්පාදනය කිරීම
16. සතුන්ගේ මස් හෝ ලේ මුහුන් කිරීම
17. සබන් නිෂ්පාදනය කිරීම
18. සත්තව ඇට ඇඹරීම සහ තබා ගැනීම
19. පෙට්ටි නිෂ්පාදනය කිරීම
20. පැරණි ලෝහ සහ අළුත් ලෝහ තබා ගැනීම
21. ලෝහ සුන් බුන් තබා ගැනීම
22. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම
23. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
24. වඩු මඩුවක් පවත්වාගෙන යාම
25. සිරප් වර්ග හෝ පළතුරු බීම නිෂ්පාදනය කිරීම
26. රස කැවිලි නිෂ්පාදනය කිරීම
27. පොල් ලෙලි පෙඟවීම (හෝ පොල් ලෙලි තැලීම)
28. බුරුසු නිෂ්පාදනය කිරීම (දත් බුරුසු හැර)
29. දත් බුරුසු නිෂ්පාදනය කිරීම
30. රා එකතු කිරීම
31. විනාකිරි නිෂ්පාදනය කිරීම
32. දැව ඉරීම
33. තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිෂ්පාදනය කිරීම
34. සෝඩා නිෂ්පාදනය කිරීම
35. ෆයිබර් වර්ණ ගැන්වීම
36. සම් භාණ්ඩ නිෂ්පාදනය
37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍යය භාජනවල ඇසිරීම
38. කෝපි හෝ ධාන්‍ය කුඩු කිරීම
39. බේකින් පවුඩර් නිෂ්පාදනය කිරීම
40. ගෑස් මැන්ටල නිෂ්පාදනය කිරීම
41. දැව ආලේප නිෂ්පාදනය කිරීම (පොටි)
42. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම
43. කපුරු නිෂ්පාදනය කිරීම
44. ලියන තීන්ත, මුද්‍රණ තීන්ත සහ ස්ටෙන්සිල් තීන්ත නිෂ්පාදනය කිරීම
45. රෙදි සේදීම සඳහා නිල් කුඩු නිෂ්පාදනය කිරීම
46. ලැකර් නිෂ්පාදනය කිරීම
47. විලවුන් වර්ග නිෂ්පාදනය කිරීම
48. පාසැල් රට හුණු නිෂ්පාදනය කිරීම
49. ටයර් සහ ටියුබ් නිෂ්පාදනය කිරීම
50. ටයර් නැවත පිරවීම
51. ටයර් ටියුබ් වැල්කනයිස් කිරීම
52. සිමෙන්ති නිෂ්පාදනය කිරීම
53. සිමෙන්ති භාණ්ඩ සහ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීම
54. වැලි කඩදාසි නිෂ්පාදනය කිරීම
55. ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
56. ගඩොල් පිළිස්සීම
57. යන්ත්‍ර භාවිත කරමින් රෙදි විවීම
58. ඔක්සිජන් නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම

59. උළු නිෂ්පාදනය කිරීම
60. පොහොර, අළු හුණු , පිටි හෝ වෙනත් ද්‍රව්‍ය බහාලන ගෝනි පිරිසිදු කිරීම සහ ඒවා විකිණීම
61. යන්ත්‍ර භාවිත කරමින් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම

## උපලේඛනය II : අන්තරාදායක ව්‍යාපාර

1. ගල් කොරි පවත්වාගෙන යාම
2. එලවළු තෙල් නිෂ්පාදනය කිරීම
3. පොල් තෙල් නිෂ්පාදනය කිරීම
4. ගිණි පෙට්ටි නිෂ්පාදනය කිරීම ගබඩා කර තැබීම
5. මෙතිලේටි ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම
6. තේපෙට්ටි නිෂ්පාදනය කිරීම
7. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
8. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය කිරීම
9. පිදුරු තබා ගැනීම
10. භාවිත කරන ලද රෙදිපිළි ගබඩා කර තැබීම
11. ආභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
12. යන්ත්‍ර භාවිත කරමින් දැව ඉරීම
13. හුණු ගල් කැණීම
14. යාන්ත්‍රික පට්ටලයක් පවත්වාගෙන යාම
15. හිස් බෝතල් සහ හිස් ගෝනි බෑග් තබා ගැනීම
16. පාපැදි සහ යතුරුපැදි අළුත්වැඩියා කිරීම
17. භාවිත කරන ලද පුවත් පත් සහ කඩදාසි ළඟ තබා ගැනීම
18. සීකර පින්තාරු වැඩ
19. ගිණි කෙළි සහ රතිඤ්ඤා ගබඩා කර තබා ගැනීම
20. ලෝහ සහ යකඩ කර්මාන්ත (යන්ත්‍රෝපකරණ, ආම්පන්න සහ භාජන නිෂ්පාදනය කිරීම)

## උපලේඛනය III : පීඩාකාරී සහ අන්තරාදායක ව්‍යාපාර

1. ග්‍රැෆයිට් පදම් කිරීම
2. කුරුඳු, කරදමුංගු කරාබු නැටි හෝ කෙඳි වර්ග රසායනික ද්‍රව්‍යය යොදා පිරිසැකසීම
3. රෙදි ඩ්‍රයි ක්ලීන් කිරීම සහ වර්ණ ගැන්වීම
4. රෙදි මත මුද්‍රණය කිරීම, වර්ණ ගැන්වීම සහ බතික් චිත්‍ර ගැන්වීම
5. විද්‍යුත් ලෝහාලේපනය
6. සත්ත්ව මේද යොදා තෙල් නිෂ්පාදනය කිරීම
7. හුණු ගල් පිළිස්සීම. ගිණි කෙළි සහ රතිඤ්ඤා නිෂ්පාදනය කිරීම
9. මෝර තෙල් පිරිසැකසුම
10. බෝට්ටු නිෂ්පාදනය කිරීම
11. බැටරි ආරෝපනය කිරීම හෝ බැටරි අළුත්වැඩියා කිරීම
12. ලෝහ පැස්සීම
13. මෝටර් රථ අළුත්වැඩියාව
14. මෝටර් රථ සේවා කිරීම
15. යන්ත්‍ර භාවිත කරමින් ලෝහ සැකසීම
16. ලේත් වැඩපළක් පවත්වාගෙන යාම
17. ටින්කරින් වැඩපළක් පවත්වාගෙන යාම
18. මොටර් රථ බඳවල් සෑදීම
19. කෘමිනාශක ,දිලීර නාශක,පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම
20. විෂ බීජනාශක නිෂ්පාදනය කිරීම
21. මදුරු දඟර නිෂ්පාදනය කිරීම

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**නින්දවූර් ප්‍රාදේශීය සභාව**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ උප වගන්ති (1), වගන්ති 123 සමඟ කියවන ලද 1989 වර්ෂයේ අංක 15 දරන **පළාත් සභා (අනුෂංගික විධිවිධාන)** පනතේ වගන්ති 2 ප්‍රකාරව නැගෙනහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන නසීර් අහමඩ් වන මා වෙත පවරනු ලබන බලතල වලට අනුකූලව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) (ළු) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව **නින්දවූර්** ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද බත් කඩ ,ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මා විසින් අනුමත කරනු ලැබ එල කිරීම සඳහා මෙයින් නියෝග කරමි.

නසීර් අහමඩ්,
නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

*බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1 මෙම අතුරු ව්‍යවස්ථාවේ මින් මතු ප්‍රාදේශීය සභාව ලෙස හඳුන්වන ලබන **නින්දවූර්** ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් ප්‍රාදේශීයසභා ප්‍රදේශය තුළ බත්කඩයක්, ආපනශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රයනිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

4 මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර කාලපරිච්ඡෙදයේ ප්‍රාදේශීයසභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා 2 හි විධිවිධානය අනනුකූල නොවන අතර එවැනි බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ මින් මතු විධිවිධාන වලට අනුව බලපත්‍රයක් ලබා ගතයුතු අතර එවැනි කාලපරිච්ඡෙදය තුල එවැනි පුද්ගලයන් බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ නඩත්තු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූල වේ.

5 ප්‍රාදේශීයසභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ වලට අනුව අයකරණ ලද ගාස්තුවක් ගෙවා ලබාගන්නා ලද ඉල්ලුම් පත්‍රය හරහා යම්කිසි පුද්ගලයන් ප්‍රාදේශීයසභා ප්‍රදේශය තුල යම්කිසි බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ නඩත්තු කිරීම සඳහා බලපත්‍රයකට ඉල්ලුම් කල හැකිය.

6 යම්කිසි සාධාරණ කාරනයක් ඇත්තේ නම් මිස නිසිලෙස සම්පූර්ණ කරණ ලද ඉල්ලුම් පත්‍රයක් ලබාගන්නා දින සිට වැඩකරන දින දාහතරක් ඇතුලත එවැනි පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කිරීම සභාව විසින් කල යුතුය.

7 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීයසභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් .

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපැලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තෙකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්,හෝ එකී දැන්වීම නිසි ආකාරයෙන් භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නීත්‍යානුකූල වියයුතු ය.

8 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ සභාපතිවරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිවරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

9 මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්‍ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්‍ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්‍ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

10 මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බත්කඩයකට, ආපනශාලාවකට, තේ හෝ කෝපි කඩයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.:

(i) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,:

(ii) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්තිගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුවද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩුවර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.:

(iii) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර්2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(iv) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම්කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(v) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.:

(vi) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(vii) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.:

(viii) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.:

(ix) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 11 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(x) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍යද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිටඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(xi) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරුතහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින්ආවරණය කර තිබිය යුතු ය.ඃ

(xii) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහනමණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක්බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබනජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xiii) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තිබෙන්නේ නම් එසේ ගබඩා කර තිබෙන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.ඃ

(xiv) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(xv) ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.ඃ

(xvi) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(xvii) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (xv) වන ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.ඃ

(xviii) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(xix) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(xx) ප්‍රාදේශීය සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අපජලය ප්‍රාදේශීයසභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අපජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.ඃ

(xxi) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.ඃ

(xxii) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන්ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

11 තීන්ත ආලේප කර තිබිය යුතු යැයි සහ මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක්වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12 බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් සෝදා කළයුතු අතර අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකටදෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

13 බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතුඅතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

14 බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනුලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුවසෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15 බලපත්‍රලත් ස්ථානයේ එකතු වන සියලුම කසළ පහත සඳහන් පරිදි 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කරඅපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊටවැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන්සියලු වේලාවන් වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

16 බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

17 (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -:

(i) ජෛවභායන අපද්‍රව්‍ය,

(ii) වීදුරු,

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,:

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,:

(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍යකළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

18 සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19 ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක සුදුසු උපකරණයක් යොදා ගත යුතු ය.

20 කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85 කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරිඅදහස් වේ.

21 (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝතැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝතැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයකකවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්තවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයටභාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22 බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයකු වෙත ම පිළිවෑසුම් සපයා තිබීමත්, එකී සේවකයන්කාර්යයයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවෑසුම් පැළඳ සිටින බවට සහතිකවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23 බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසුසහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

24 කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ බුලත් හෝ වෙනත් සෞඛ්‍යට හිතකර නොවන කවර හෝ ද්‍රව්‍යක් සැපීම නොකළ යුතු ය.

25 මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට බලපත්‍රලත් ස්ථානයෙහි නිෂ්පාදනය කරන ලද යම් කිසි ඕනෑම අවස්ථාවක් සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීම සඳහා නිසි කාලය බැව් සඳහන් වේ.

26 සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑමවර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

27 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බලපත්‍රලත් ස්ථානය 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබනදිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

28 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කරඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනුලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

29 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කරඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

30 මෙම අතුරු ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ විධිවිධාන යම් තැනැත්තෙකු විසින් ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුළ උල්ලංඝණය කිරීම 1987 වර්ෂයේ අංක 15 දරණ ප්‍රදේශිය සභා පනතේ 122(2 ) වෙනි ඡෙදයේ විධිවිධානවලට අනුකූලව නිසිලෙස ඇති අධිකරණයක් විසින් වරද කරු කරණු ලැබීමෙන් අනතුරුව

(v) ඒ තැනැත්තා විසින් කඩකිරීම හෝ උල්ලංඝණය කීරිම වරදක් සම්බන්දයෙන් රු 750.00ක දඩමුදලක් ගෙවිය යුතුය.:

(vi) ඒ තැනැත්තා විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක එම කඩකිරීම් හෝ උල්ලංඝණය සිදුවන දිනක් වෙනුවෙන් රු 250.00ක දඩ මුදලක් ගෙවිය යුතුය.

31 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව ද,"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකුඅදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම්ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ යම්නිලධාරියෙකු ද,

"ලේකම්වරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම්නිලධාරියෙකු ද,

"සභාපතිවරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, අදහස් විය යුතුයග

"ආපන ශාලාව හෝ බත් කඩය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනයකරන ස්ථානයක් අදහස් වන අතර, කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාරවර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය,

"තේ හෝ කෝපි කඩය" යන්නෙන්, බේකරි නිෂ්පාදන හෝ වෙනත් කෙටි ආහාර සමඟ තේ හෝ කෝපි විකිණීම සඳහා පවත්වාගෙනයනු ලබන ස්ථානයක්,අදහස් වේ.

1 - 903/4

---

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**නින්දවූර් ප්‍රාදේශීය සභාව**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ උප වගන්ති (1), වගන්ති 123 සමඟ කියවන ලද 1989 වර්ෂයේ අංක 15 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ වගන්ති 2 ප්‍රකාරව නැගෙනහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන නසීර් අහමඩ් වන මා වෙත පවරනු ලබන බලතල වලට අනුකූලව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (XXIII) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නින්දවූර් ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද කොණ්ඩා සකසන ස්ථාන,බාබර් සාප්පු හා සැලුන්හල් සහා රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මා විසින් අනුමත කරනු ලැබ එල කිරීම සඳහා මෙයින් නියෝග කරමි.

නසීර් අහමඩ්,<br>නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා<br>පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 නොවැම්බර් මස 06 වැනි දින,<br>ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,<br>නැගෙනහිර පළාතේ පළාත් සභාව,<br>ඇතුල් වරාය පාර,<br>ත්‍රිකුණාමලය.

*කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1 මෙම අතුරු ව්‍යවස්ථාවේ මින් මතු ප්‍රදේශීය සභාව ලෙස හඳුන්වන ලබන නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් ,බාබර් සාප්පුවක්, සැලූන්හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4 මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර කාලපරිච්ඡෙදයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා 2 හි විධිවිධානය අනනුකූල නොවන අතර එවැනි කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ මින් මතු විධිවිධාන වලට අනුව බලපත්‍රයක් ලබා ගතයුතු අතර එවැනි කාලපරිච්ඡෙදය තුළ එවැනි පුද්ගලයන් කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ නඩත්තු කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූල වේ.

5 ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ වලට අනුව අයකරණ ලද ගාස්තුවක් ගෙවා ලබාගන්නා ලද ඉල්ලුම් පත්‍රය හරහා යම්කිසි පුද්ගලයන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම්කිසි කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ නඩත්තු කිරීම සඳහා බලපත්‍රයකට ඉල්ලුම් කල හැකිය.

6 යම්කිසි සාධාරණ කාරනයක් ඇත්තේ නම් මිස නිසිලෙස සම්පූර්ණ කරණ ලද ඉල්ලුම් පත්‍රයක් ලබාගන්නා දින සිට වැඩකරන දින දාහතරක් ඇතුලත එවැනි පුද්ගලයකුට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කල යුතුය.

7 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් .

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපැලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපැලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තෙකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්,හෝ එකී දැන්වීම නිසි ආකාරයෙන් භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නිත්‍යානුකූල වියයුතු ය.

8 මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ සභාපතිවරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිවරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

9 මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

10 (අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ කොණ්ඩා සැකසීමේ ස්ථානයක්, බාබර් සාප්පුවක් , සැලූන්හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) කොණ්ඩා සැකසීමේ ස්ථානය, බාබර් සාප්පුව ,සැලුන්හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස -

(i) ශක්තිමත්ව නිමාකර තිබිය යුතු අතර එක් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන් කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5කට නොඅඩු වනසේ එකවර සේවා සපයන ගණුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය.

(ii) සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගණුදෙනුකරුවකුට සේවා ලබාගන්නා ගණුදෙනුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5ක් දුරින් වනසේ පහසුවෙන් අසුන්ගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩ කඩ සපයා තිබිය යුතු ය,

(iii) ඇතුලත් වන බිත්ති ශක්තිමත් ද්‍රව්‍ය වලින් තනා තිබිය යුතු අතර තීන්ත ආලේපකර තිබිය යුතු ය,

(iv) ඇතුලත් වන වහළය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුවාත් හැර අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25ක් උස සිවිලිමකින් යුක්ත විය යුතු ය. තව ද, සිවිලිම සුදු පාටින් පින්තාරු කර තිබිය යුතු ය,:

(v) ඇතුළත පොළොව සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය සහ පොළොව සම්බන්ධවන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතු ය,:

(vi) ඇතුළත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහලොවෙන් එකකට නොඅඩු වා කවුළු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතු ය,:

(vii) ඇතුළත වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතු ය,:

(viii) ගණුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී සේදීම සඳහා ජලය භාවිත කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කළ අපජලය ගලායාමට ප්‍රමාණවත් නළ සවිකර තිබිය යුතු ය,

(ix) ඇතුළත භාවිත කර බැහැර කරන අපජලය උරා ගැනීමේ වලකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකළ යුතු ය,

(x) ඇතුළත හෝ පරිශ්‍රය ඇතුළත ජලමුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය,

(xi) ඇතුළත නිවාසයක කාර්යය සඳහා යොදා ගැනීම නොකළ යුතු අතර නිවාසය

සඳහා යොදාගන්නා කොටසෙන් වෙන්කර තිබිය යුතු ය.

(ඇ) කොණ්ඩා සැකසීමේ ස්ථාන හෝ බාබර් සාප්පුව හෝ සැලුන්හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථාන

(i) ගණුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවක දී ම ප්‍රමාණවත් ජලසම්පාදනයක් තිබිය යුතුය.:

(ii) පවත්වාගෙන යාමේ දී පාවිච්චි කරන උපකරණ සහ මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරවන ක්‍රමයක් හෝ ජීවානුහරණ ක්‍රමයක් සහ ජීවානුකරණය සඳහා භාවිත කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතුය. ,

(iii) ඇතුළත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේ දී අත් සෝදා ගැනීමේ පහසුකම් සහිත බේසම් සහ සබන් හෝ සබන් දියර තිබිය යුතුය.

(iv) ගණුදෙනු කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටකින් යුක්ත වන එහෙත් තද පාටින් යුක්ත නොවන තුවා සහ උඩුකය ආවරණ වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතුය.:

(v) ඇතුළත දී කපන ලද කෙස් සහ වෙනත් අපද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසෙන පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් තිබිය යුතුය. ,

(vi) ඇතුළත විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදා ගන්නේ නම් එක් ගණුදෙනු කරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින් තිබිය යුතුය.

(vii) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක්, සපයා තිබිය යුතු ය.

11 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයක ම සේවයේ යොදවා ඇති තැනැත්තෙකුට ම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයේ ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පෙරහුරුවක් ලබා දී තිබිය යුතු ය.

12 තීන්ත ආලේප කර තිබිය යුතු යැයි සහ මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකු ම විසින් බලපත්‍රලත් ස්ථානයේ ගෙබිම අවම වශයෙන් මාස තුනකට වරක් වත් විෂබීජ නාශක යොදා සෝදා හැරීම කළ යුතු ය.

14 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු ය.

15 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතු ය.

16 (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු ට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයකකවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමහෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

17 කවර හෝ ආකාරයක හෝ ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කළ කිසියම් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව

(අ) එකී සේවා සැපයීම කළ තැනැත්තා යම් විෂබීර නාශක ද්‍රව්‍යයක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) එකී ගණුදෙනුකරුවා සඳහා පාවිච්චි කළ කවර හෝ උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස සහ පාවිච්චි කළ තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

18 බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකු ම

(අ) දිනපතා දිය නෑමෙන් හෝ ඇඟ සෝදා ගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට,

(ආ) අඳින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් වන බවට,

(ඇ) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබා ගන්නා බවට, සහ

(ඇ) එක් එක් ගණුදෙනුකරු සඳහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට,

සහතික වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

19 බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(අ) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරනය කිරීම,

(ආ) බුරුසු සහ පනා සෑම දිනයකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදු කර ජීවානුහරණය කිරීම,

(ඇ) සියලුම පූකුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණුවතුරෙහි ගිල්වා සෝදා හැරීම, කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතු ය.

20 බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා එක් එක් ගණුදෙනුකරුගේ

(අ) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උරා ගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර, ඒ සඳහා වෙන්කළ භාජනයකට දැමීම කරන බවට, සහ

(ආ) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරු කළ හැකි දැළි පිහියේ තලය මාරු කරන බවට, බලපත්‍රලාභියා සහතික විය යුතු ය.

21 දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති අපද්‍රව්‍ය අවම වශයෙන් පොළොවෙන් මීටර් එකකට නොඅඩු ගැඹුරකින් වළ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය. එසේ ම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුළ යම් පොදු ස්ථානයක විසිරී යාම වැළැක්වීමට ක්‍රියාකිරීම ද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22 බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අපද්‍රව්‍ය 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවක දී ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රාදේශීය සභාවේ කසළ රැස්කිරීමේ වාහනයකට භාර දීමට ක්‍රියා කළ යුතු ය.

23 බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අපද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

24 කවර හෝ බලපත්‍රලත් ස්ථානයක

(අ) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ පියරු මලක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක්, හෝ

(ආ) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක්, එය කුඩු වශයෙන් හෝ ද්‍රව වශයෙන් ඇත්නම් මිස කිසිම ගණුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

25 කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩු කය ආවරණ වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමුවරට පාවිච්චි කරන තුවායක් නොවන කිසියම් තුවායක් හෝ කවර හෝ ගණුදෙනු කරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

26 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයක් සභාපතිවරයාගේ ලිඛිත අවසරය ඇත්තේ නම් මිස නොකළ යුතු ය.

27 මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට, පරීක්ෂණ කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට එකී ස්ථානයේ ගණුදෙනුකරුවන්ට සේවා සැපයීම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

28 මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් ස්ථානයක් 10 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටුකරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැළැස්විය යුතු ය.

29 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත්

කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය.

30 29 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

31 මෙම අතුරු ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ විධිවිධාන යම් තැනැත්තෙකු විසින් ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුළ උල්ලංඝණය කිරීම 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122(2 ) වෙනි ඡෙදයේ විධිවිධානවලට අනුකූලව නිසිලෙස ඇති අධිකරණයක් විසින් වරද කරු කරණු ලැබීමෙන් අනතුරුව

(vii) ඒ තැනැත්තා විසින් කඩකිරීම හෝ උල්ලංඝණය කීරිම වරදක් සම්බන්දයෙන් රු 750.00ක දඩමුදලක් ගෙවිය යුතුය.

(viii) ඒ තැනැත්තා විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක එම කඩකිරීම් හෝ උල්ලංඝණය සිදුවන දිනක් වෙනුවෙන් රු 250.00ක දඩ මුදලක් ගෙවිය යුතුය.

32 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාව ද,

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙහි කවර හෝ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙහි කවර හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"ලේකම්වරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"සභාපතිවරයා" යන්නෙන්, නින්දවූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, අදහස් විය යුතුය.

"උඩුකය ආවරණ වැස්ම" යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා කිසියම් ගණුදෙනුකරුවෙකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන කිසියම් ආවරණ රෙද්දක් අදහස් වේ.

01 - 905/5